# සරුංගල් බිංදු



ඕෂියානා ශෙල්බි රත්නායක ඉහළගමගේ

# “සරුංගල් බිංදු”


**<u>කතාව සහ  රූප නිර්මාණය</u>**

**ඔෂියානා ශෙල්බි රත්නායක ඉහලගමගේ**

**2 වසර E**

**මහමායා බාලිකා විදුහල  , මහනුවර**



**2023.11.15**

**ISBN – 978-624-206-871-8**


**<u>කතෘ ගේ වෙනත් කෘති</u>**

1. සමනල මල

2.පුංචි වලස් පැටියා

3.සමදරා

4.හඳ හාමි මගේ අතේ

5.පුංචි සමනලී

6.මම ආසම පාට

7.සල්මලී

8.කුරුළු තාත්තා සහ අම්මා

9.මලිති බබා

මා හට  අකුරු කියා දුන් මගේ අච්චාටත්, අම්මාටත් සෑම අයුරින් මා හට උදව් උපකාර කළ  චාමිනි පල්ලියගුරු මාගේ පංතිභාර ගුරුතුමියටත් ආදරයෙන් පුදමි !



පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

2023 10 20

එකෝමත් එක කාලෙක
දුප්පත් ළමයෙක් හිටියා.
එයාගේ නම "සරුංගල් බිංදු".



එයා හරි ආසයි සරුංගල් යවන්න.

ඒත් එයා ළඟ සරුංගලයක් ගන්න සල්ලි තිබුණේ නැහැ.

එයා අම්මාට මෙහෙම කිව්වා..

“අම්මේ මට ආසයි සරුංගලයක් ගන්න, ඈත අහසේ පියාසර කරවන්න”



ඒත් අම්මේ මගේ අතේ සල්ලි නැහැනේ" ....
අම්මා බිංදු ගේ ඔළුව
අතගාලා මෙහෙම කිව්වා.



# “පුතේ අපි අත්තම්මාගෙන් අහලා බලමු”

# බිංදු හිමින් සැරේ අත්තම්මා ළඟට ගියා.

“අත්තම්මේ, අත්තම්මේ...
මට පොඩි දෙයක්
අත්තම්මාගෙන් ඉල්ලන්න
තියෙනවා”
“මොකද්ද පුතේ...? “



“අත්තම්මා මට සරුංගලයක්
අරන් දෙනවද ?”
“ අනේ, ඕක සුළු දෙයක්නේ
පුතේ මම අරන් දෙන්නම් ”.
අත්තම්මා කිවුවා.
බිංදු හරිම සතුටින් නින්දට
ගියා.
පහුවදා උදේන්ම බිංදු පාසැල්
යන්න නැගිට්ටා.



මුණ කට සෝදා පිරිසිදු වී
අත්තම්මාටත්,
අම්මාට හා තාත්තාටත් වැඳ
බිංදු  පාසැල් ගියා.

පාසැල් නිම වී ගෙදර එනවිට ගෙදර ඉස්තෝප්පුවේ දිගම දිග සරුංගලයක් එල්ලා තිබුණා.
නොයෙකුත් පාට සරුංගලයට එකතු කරලා තිබුණා.



පුංචි බිංදු සතුටින් කෑගැහුවා.
අත්තම්මාව තදින් තුරුලු කරගත්තා.
“බොහොම ස්තූති ඔයා මම ආසම දේ ගෙනත් දුන්නාට” කියමින් බිංදු අත්තම්මාට ස්තූති කළා.



මුළු දවසම සරුංගලය එක්ක සෙල්ලම් කරමින් කාලය ගත කළා.

ගෙදර හැමෝම බිංදුට 'සරුංගල් බිංදු ' යැයි නම තැබුවා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20